" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අැප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

SLSI ISO 9001 | SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2021 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2021.11.25 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක **GOS/ADM/12/8/19** හා **2021.11.24** දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2021.10.07 MH/TA/G/PSM/05/2020 | කොවිඩ් 19වසංගත කාල සීමාවේදී ක්ෂේත්‍ර රාජකාරි කටයුතු වල නිරත මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා අතිකාල දීමනා ලබා දීම. |
| 02 | 2021.10.07 01-33/2021 | 1997.01.01 දිනෙන් පසු විශ්‍රාම ගිය ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් නොලැබීම. |
| 03 | 2021.10.05 02-75/2021 | ශ්‍රී ලංකා හෙද සේවයේ ශ්‍රේණිගත උසස්වීම් සඳහා සලකා බලනු ලබන කාලසීමාව සංශෝධනය කිරීම. |
| 04 | 2020.01.17 01-07/2020 | මහජන සෞඛ්‍ය හෙද සොයුරියන් සහ මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් (ජංගම දුරකථන හා අන්තර්ජාල පහසුකම්)සඳහා වූ මාසික බිල්පත් නිරවුල් කිරීමට අනුමැතිය ලබා දීම. |
| 05 | 2021.05.21 09/2021 (රා.ප. චක්‍රලේඛයකි) | උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා නිවාඩු ලබා දීම. |
| 06 | 2021.06.30 14/2021 (රා.ප. චක්‍රලේඛයකි) | ජාතික ක්‍රීඩා දිනය ප්‍රකාශයට පත් කිරීම. |
| 07 | 2021.10.22 02/2021 (රා.ප. චක්‍රලේඛයකි) | කොවිඩ් 19 ආසාධිත රජයේ නිලධරයන් සඳහා අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවීම. |

| | | |
|---|---|---|
| 08 | 2021.11.05<br>23/2021<br>(රා.ප. චක්‍රලේඛයකි) | රාජ්‍ය ආයතනවල නිලධරයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ දත්ත "ඉ-ග්‍රාම නිලධාරි " පද්ධතියට ඇතුලත් කිරීම. |

**02.** එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 09/2021

මගේ අංකය: EST-6/03/LEA/3186-1
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2021.05.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

## උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා නිවාඩු ලබා දීම

රැකියා විරහිත උපාධිධාරීන්ට/ ඩිප්ලෝමාධාරීන්ට රාජ්‍ය ආයතනවල අභ්‍යාසලාභී පුහුණුව ලබා දීම - 2020 වැඩසටහන යටතේ රාජ්‍ය ආයතන වෙත පුහුණුව සඳහා අනුයුක්ත කර ඇති අභ්‍යාසලාභීන්ගේ නිවාඩු සම්බන්ධව පහත පරිදි කටයුතු කිරීමට 2021.05.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

I. සියලුම අභ්‍යාසලාභී උපාධිධාරීන්ට පුහුණු කාලසීමාව තුළ මසකට වැටුප් සහිත නිවාඩු දින දෙකක් (02) ලබා දීම සහ එම දින දෙකට (02) අමතරව මසක් තුළ ලබා ගන්නා නිවාඩු වැටුප් රහිත නිවාඩු ලෙස සලකා මාසික දීමනාවෙන් 1/30කට සමාන කොටස බැගින් අඩු කිරීම.

II. වසරක පුහුණු කාලසීමාවක් සඳහා බඳවාගෙන ඇති කාන්තා උපාධිධාරී අභ්‍යාසලාභීන්ට දරු උපතක් සඳහා දරුවාගේ උපතේ සිට සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර දින අසූ හතරක (84) සම්පූර්ණ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු ලබා දීම.

III. උපාධිධාරී අභ්‍යාසලාභී පත්වීම ලැබෙන අවස්ථාව වන විට දරු උපත සිදු වී දින අසූ හතරක් (84) ඉක්මගොස් නොමැති සියලුම කාන්තා උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා මෙම විධිවිධාන අදාළ කොටගෙන මෙදිනට පෙර වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත්නම් එම වැටුප් රහිත නිවාඩු සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලෙස සැලකීම.

02. ඒ අනුව අවශ්‍ය කටයුතු කරන ලෙස හා ඔබ යටතේ ඇති සියලුම ආයතන ද දැනුම්වත් කරන ලෙස දන්වා සිටිමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය